පොලිතින් සහ නොදිරන කසලවලින් තොර කලාපයක්...

ලියන ලද්දේ Museum Department
2017 මැයි 05 වෙනි සිකුරාදා, 04:11 - අවසන් යාවත්කාලීන කිරීම 2017 මැයි 12 වෙනි සිකුරාදා, 02:34

කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රය පොලිතින් සහ නොදිරන කසලවලින් තොර කලාපයක්........

දැනට ජාතික අර්බුදයක් බවට පත්ව ඇති කැලි කසල ගැටළුවට විසඳුමක් වශයෙන් 2017.05 .15 දින සිට කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රය පොලිතින් සහ නොදිරන කසලවලින් තොර කලාපයක් බවට පත් කිරීමට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

කොළඹ ජාතික කෞතුකාගාරය සහ එම පරිශ්‍රයමේ පිහිටි ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන නරඹන්නන් විසින් කෞතුකාගාර පරිශ්‍රය වෙත රැගෙන එන අපද්‍රව්‍ය විධිමත් ලෙස බැහැර නොකරන නිසාත්, එම අපද්‍රව්‍ය කෞතුකාගාර පරිශ්‍රයේ තැන් තැන්වල අවිධිමත් ලෙස දැමීම නිසාත් දැඩි පාරිසරික ගැටළුවකට මුහුණ දීමට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට සිදු වී ඇත. විශේෂයෙන් නරඹන්නන් විසින් කෞතුකාගාර පරිශ්‍රය තුළ තැනින් තැන දමා ඇති ඉතිරි කෑම වර්ග වලින් හමන දුර්ගන්ධයත්, යෝගට් කෝප්ප, පොලිතීන් කවර ආදිය නිසාත්, කෞතුකාගාර පරිශ්‍රය නරඹන්නන් හට ප්‍රසන්න ස්ථානයක් වශයෙන් පවත්වාගෙන යාමට බාධා පැමිණේ. මෙම සියලු හේතු සැලකිල්ලට ගනිමින් කෞතුකාගාර පරිශ්‍රය නරඹන්නන් හට ප්‍රසන්න ස්ථානයක් වශයෙන් පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යාමේ අරමුණ ඇතිව, එහි මූලික පියවර වශයෙන් ජාතික කෞතුකාගාර පරිශ්‍රය පොලිතින් සහ නොදිරන කසලවලින් තොර කලාපයක් බවට පත් කිරීමට තීරණය කරන ලදී.

එබැවින් ජාතික කෞතුකාගාරය හා ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය නැරඹීමට පැමිණීමේදී පොලිතින් වලින් ඔතන ලද කෑම පාර්සල්, පොලිතින් ආවරණ සහිත වෙනත් කෑම වර්ග, ප්ලාස්ටික් වතුර බෝතල් හා බීම බෝතල්, රිජිෆෝම් ආවරණ සහිත කෑම පාර්සල් ආදිය රැගෙන ඒමෙන් වළකින ලෙස නරඹන්නන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

එසේම නරඹන්නන් විසින් කෞතුකාගාර ආපන ශාලාවෙන් මිළ දී ගන්නා පොලිතින්, රිජිෆෝම් හෝ ප්ලාස්ටික් ආවරණ සහිත කෑම හා බීම වර්ග වල ඇසුරුම් කෞතුකාගාර පරිශ්‍රය තුළ නොදමා ආපසු රැගෙන යන ලෙසත් කාරුණිකව දන්වමි. එමෙන්ම විධිමත් ලෙස වර්ග කොට බඳුන් වලට කසල නොදමන බැවින් දැනට කෞතුකාගාර පරිශ්‍රයේ තබා ඇති කසල බඳුන් මින් ඉදිරියට එම ස්ථාන වලින් ඉවත් කිරීමට සිදුවන බවත් වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

කෞතුකාගාර පරිශ්‍රය නරඹන්නන් හට ප්‍රසන්න සහ පරිසර හිතකාමී ස්ථානයක් බවට පත් කිරීමේ අරමුණ ඇතිව ගන්නා ලද මෙම තීරණය නිසා යම් පාර්ශවයකට අපහසුතාවයක් සිදු වුවහොත් එම පාර්ශවයන් වෙත ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කනගාටුව ප්‍රකාශ කර සිටී.